# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2110/40 - 2019 පෙබරවාරි මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2019.02.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

අංක 32 සහ 33 යටතේ නියෝග

විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍ය හරීන් ප්‍රනාන්දු වන මා 1973 අංක 25 දරන ක්‍රීඩා පනතට අනුව මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව දැනට ලියාපදිංචිය අත්හිටුවා ඇති බැඩ්මින්ටන් ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන ශ්‍රී ලංකා බැඩ්මින්ටන් හි නීත්‍යානුකූල නිලවරණය පවත්වන තෙක් තාවකාලික වැඩපිළිවෙලක් වශයෙන් 2018.01.08 වන දින නිකුත් කරන ලද අංක 2053/06 දරන ගැසට් නිවේදනය මගින් පත් කරන ලද මුල් අතුරු පාලක කමිටුවේ සාමාජිකයෙකු වන,

1. ජී. ජී. මංගල - භාණ්ඩාගාරික

යන නිලධාරියා සහ 2018.04.12 දින නිකුත් කරන ලද අංක 2066/41 දරන ගැසට් නිවේදනය මගින් එම කමිටුවේ සාමාජිකයන් දෙදෙනෙකු වශයෙන් පත් කරන ලද,

1. කාරියවසම් ගෝනපීනුවල ගමගේ අංජන් මොහාන් විජේසිංහ - ලේකම්
2. වසන්ත කුමාර - උප සභාපති

යන නිලධාරීන් දෙදෙනා ඇතුළුව අදාළ නිලධාරීන් ඉල්ලා අස්වීමෙන් පුරප්පාඩු වූ තනතුරු 03 වෙනුවෙන් පහත සඳහන් නිලධාරීන් තිදෙනා 2019.02.14 දින සිට පත් කරන බව මෙයින් දන්වා සිටිමි.

1. ලියන ආරච්චි අප්පුහාමිලාගේ දීපාල් ලියනාරච්චි මයා - උප සභාපති
2. වන්නිනායක මුදියන්සේලාගේ වසන්ත සිසිර වන්නිනායක මයා - භාණ්ඩාගාරික
3. මිරිමානයේ ජුඩිත් ප්‍රියානි පෙරේරා මයා - ලේකම්

එමෙන්ම ශ්‍රී ලංකා බැඩ්මින්ටන් හි නිලවරණ පැවැත්වීම සඳහා 1973 අංක 25 දරන ක්‍රීඩා පනත සහ සංශෝධිත රෙගුලාසි අනුව බැඩ්මින්ටන් සංගමයේ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවා එමගින් නිලවරණ කමිටුවක් පත් කිරීමට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය යටතේ අතුරු පාලක කමිටුව මගින් සිදු කිරීමට බලය පවරමි.

හරීන් ප්‍රනාන්දු,
විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍ය.

2019 ක් වූ පෙබරවාරි මස 14 වැනි දින,
කොළඹ දී ය.

03 - 134

1A - G 29461 — 22 (2019/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*